අපේ වී ගොවිතැන හා යාය ආදර්ශණ වැඩ සටහන

ශ්‍රී ලංකාවේ වී වගා ඉතිහාසය. ක්‍රි.පු. 1000 ක පමණ අතීතයකට දිවයන බැව් පිලිපීනයේ අන්තර් ජාතික සහල් පර්යේෂණ ආයතනයේ වාර්තා වල සඳහන් වේ. ක්‍රි. පූර්ව 543 දී විජය රජ ලංකාවට පැමිණි පසුව එවකට නායිකාව වු කුවේණිය විසින් බත් සහ වැංජන සමග ආහාරයකින් රජුට සංග්‍රහ කල බැව් මහාවංශයේ සඳහන් වේ. කෙසේ වෙතත් ක්‍රි.පු. 161 සිට ක්‍රි.වර්ෂ 1197 දක්වා ලංකාවේ රජකල මහසෙන්, ධාතුසේන, මහා පරාක්‍රමබාහු යන රජවරුන් ශ්‍රී ලංකාවේ වී වගාවේ සංවර්ධනය සම්බන්ධයෙන් මහඟු කාර්යයන් කර ඇති බැව් ඉතිහාස පොත් වල සඳහන් වේ. මහා පරාක්‍රම බාහු රජ ඉතිහාසයේ පළමු වතාවට වී වගාවේ ඵලදායීතාවය වැඩි කිරීම සඳහා ජනතාව පෙළගැස්වීම විශේෂයෙන් සඳහන් කල යුතුය.

අතීත රජ දවස වී වගා වපසරිය, අස්වනු ප්‍රමාණයන්, නිෂ්පාදනය පිළිබඳ වර්තමාන සම්මත ආකාරයෙන් දත්තයන් සොයා ගැනීම අපහසුයි. මෑත ඉතිහාසයේ ලියන ලද වාර්තා අනුව වර්තමාන සම්මත ආකාරයන්ට ගැලපෙන දත්තයන් 1930 සිට ඒ ඒ දශකයේ සාමාන්‍ය අගයන් ගණනය කර ඇත. ඒ අනුව 1940 (1930-1940) සිට 2000 දශකය (1990-2000) දක්වා ලංකාවේ වාර්ෂිකව වගාකළ බිම් ප්‍රමාණයන්, අක්කර අස්වැන්නත්, වී නිෂ්පාදනය. රටේ ජනගහනය හා රටට ආනයනය කල සහල් ප්‍රමාණයන් ප්‍රතිශතයන් පහතින් දක්වා ඇත.

වගුව අංක 1: ශ්‍රී ලංකාවේ වී වගාව නිෂ්පාදන

මෙම දත්ත ගැන විමසිල්ලෙන් බලන විට පසුගිය වසර 60 තුළ ශ්‍රී ලංකාවේ වගා වපසරිය ආසන්න ලෙස දෙගුණයකින් වැඩිවී ඇති බැව් පෙනේ. මෙය ගැන තවත් විමසා බැලුවහොත් වී වගාව තෙත් කලාපයේ සිට වියලි කලාපයට සංක්‍රමනය වන බවක් ද පෙනෙන්නට ඇත. විශේෂයෙන් මහවැලි සංවර්ධන යෝජනා ක්‍රම ඇතුළු වාරිමාර්ග ක්‍රම

ශාන්ත සිරි ඇම්ටියගොඩ
නියෝජ්‍ය අධ්‍යක්ෂ (මූලස්ථාන)

ප්‍රගතිය - (1940 - 2000 දශකය දක්වා)

දශකය	වපසරිය අක්කර 000,	අස්වැන්න අක්කරයට බුසල්	නිෂ්පාදනය බුසල් දශලක්ෂ	ජනගහනය මිලියන	ආනයනය මුළු නිෂ්පාදනය % ලෙස
1940	980	13	12.8	6.6	60
1950	970	934	33.5	9.3	50
1960	1242	42	52-1	11.6	40
1970	1539	49	76.4	13.7	25
1980	1748	66	116	16.0	10
1990	1993	70	120	18.6	5
2000	2000	76	140	18.6	1

ඇතිවීම මෙම වාර්ෂික වගා බිම් ප්‍රමාණය දෙගුණයක් වීමට හේතු වී ඇත.

1940 සිට 2000 දශක දක්වා ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අස්වැන්න අක්කරයට බුසල් 13 සිට 75 දක්වා ආසන්න ලෙස 5 ගුණයකින් වැඩිවී ඇති බැව් පෙනේ. මෙය නිසාම නිෂ්පාදනය ආසන්න ලෙස දෙලොස් ගුණයකින් වැඩිවී ඇත. අස්වැන්න 5 ගුණයකින් වැඩිවීම මෙම නිෂ්පාදනය දහ ගුණයකින් වැඩිවීමට ප්‍රධාන ලෙස බලපා ඇත.

මෙම කාලය තුළ රටේ ජනගහනය වැඩිවීම ආසන්න වශයෙන් තුන් ගුණයක් වුවත්, ඉහත නිෂ්පාදනය වැඩිවීම නිසා මෙරට සහල් ආනයන කරන ලද ප්‍රමාණය රටේ නිෂ්පාදනයෙන් ප්‍රතිශතයක් ලෙස 60% සිට 1% දක්වා අඩුවී ඇත. මෙය ශ්‍රී ලංකාවේ ආර්ථිකයට වර්තමානයේ අති මහත් සහනයකි. මෙරට සහල් ප්‍රමාණයෙන් 25% ක් වත් ආනයනය කිරීමට තිබුණි නම් අපේ ආර්ථිකය ඉතා විශාල අර්බුද රාශියකට මුහුණ පා, පවතින යුද්ධමය වාතාවරණය මත රට අරාජික වීමටද ඉඩ තිබුණි. එබැවින් අප සහලින් ලබා ඇති ප්‍රගතිය මේ සම්බන්ධයෙන් පැසසුම් කටයුතුයි.

අස්වැන්න වැඩිවීම සඳහා කෘෂි තාක්ෂණයේ දියුණුව විශේෂයෙන් වී වගී, පොහොර, කෘමි පාලන දියුණු වීම, එම තාක්ෂණයන් ගොවි ජනතාව අනුගමනය කිරීම හා එම කාර්ය භාරයට සම්මාදම් වූ රජයේ නිලධාරීන්ටත්, ගොවි ජනතාවටත් ජාතියේ ප්‍රණාමය පුදකල යුතු වේ.

වර්තමාන තත්වය

වර්තමානයේ ලංකාවේ අස්වද්දන ලද කුඹුරු ඉඩම් අක්කර 18,25,000 ක් ඇති අතර මෙයින් මහා වාරිමාර්ග යටතේ අක්කර 8,37,000 (45%) ක්ද, සුළු වාරිමාර්ග යටතේ අක්කර 4,25,000 (25%) ක්ද වර්ෂාපෝෂිත යටතේ අක්කර 5,63,000 (30%) ක්ද ජලයෙන් පෝෂණය වේ.

සාමාන්‍යයෙන් දැනට මහ කන්නයේදී (ඔක්. සිට මාර්තු දක්වා) කුඹුරු ඉඩම් අක්කර 13,75,000 ක් වගාවෙන අතර යල කන්නයේදී (අප්‍රේල් සිට සැප්තැම්බර්) දක්වා අක්කර 7,75,000 ක් වගාවේ. එබැවින් වර්ෂයක් තුළ වගා වෙන්නේ අක්කර 21,50,000 කි. වාර්ෂික වගා තීව්‍රතාවය යල මහ දෙකම වගා කරන ඉඩමක 200% විය යුතු නමුත් ශ්‍රී ලංකාවේ වී වගාවේ වගා





තිව්‍රතාවය 117% කි. මහ කන්නයකදී සාමාන්‍ය නිෂ්පාදනය බුසල් මිලියන 90 ක් වන අතර යල කන්නයේදී සාමාන්‍ය නිෂ්පාදනය බුසල් මිලියන 50 කි. ඒ අනුව වාර්ෂික වී නිෂ්පාදනය බුසල් මිලියන 140 කි. දැනට වාර්ෂික වී අවශ්‍යතාවය බුසල් මිලියන 144 ක් වන අතර එබැවින් අපගේ සහලින් ස්වයංපෝෂිත භාවය 97% පමණ වේ. ඒක පුද්ගල පරිභෝජනය වසරකට සහල් කිලෝ ග්‍රෑම් 100 ක් වන අතර ජනගහනය මිලියන 18.6 නිසා වාර්ෂික සහල් අවශ්‍යතාවය මිලියන ටොන් 1.86 කි. මාසිකව සහල් ටොන් 1,60,000 ක් අවශ්‍ය වේ. 6% පසු අස්වනු හානි හා 65% සහල් ප්‍රතිශතයක් ලෙසත් වාර්ෂික බිත්තර වී අවශ්‍යතාවය බුසල් මිලියන 4 ක් වශයෙන් සැලකූ විට වසරකට අවශ්‍ය වී ප්‍රමාණය බුසල් මිලියන 144 කි.

වී වගාවේ අර්බුදය

ශ්‍රී ලංකාවේ වී වගාව ඉහත ආකාරයට සිදුවුවත් 1980 මුල් භාගයේ පටන් 1990 අවසන් භාගය දක්වා වී වගාවත් එම කර්මාන්තයේ විශාල අභියෝග රාශියකට මුහුණ පෑමට සිදුවිය. ඒ අතර

1. අස්වැන්න හා නිෂ්පාදනය වැඩි නොවී එක තැන ඇනහිටීම.
2. නිෂ්පාදන වියදම වැඩිවීම හා ආදායම වැඩි නොවීම හා වී වගාව අලාභදායී වීම.
3. වී වගා බිම් වගා නොකර අත් හැරීම.
4. තරුණ පරම්පරාව වී වගාවෙන් ඈත්වීම.
5. වී වගාව සඳහා කම්කරුවන් නොමැතිවීම.
6. ගුණාත්මය අඩු සහල් පාරිභෝගිකයින්ට ලැබීම.
7. වී වෙළඳ පොළ ගැටලු හා රාජ්‍ය අනුග්‍රහයේ අඩු පාඩුකම් ඇතුළු ගැටලු රාශියකට ශ්‍රී ලාංකික සහල් කර්මාන්තයට අත් විඳීමට සිදුවිය.

අස්වැන්න හා නිෂ්පාදනය ඇනහිටීම

පහත අංක 2 වගුව පරිදි 1980 පටන් 1999 දක්වා ශ්‍රී ලංකාවේ වී වගාවේ සාමාන්‍ය අස්වැන්න අක්කරයට බුසල් 70 පමණ පමණ වැඩි නොවී එකම මට්ටමක පැවතින. නිෂ්පාදනයත් එලෙසම වැඩිවීමක් නොවී එක් මට්ටමක පැවතින. නමුත් පාරිභෝගික ජනගහනය ආසන්න ලෙස දිනකට 700 පමණ වැඩිවුවත් ඒ වැඩි වන අවශ්‍යතාවය අනුව නිෂ්පාදනය වැඩි නොවිනි.

වගුව අංක 2: ශ්‍රී ලංකාවේ වී අස්වැන්න හා නිෂ්පාදනය

වී වගාව ආර්ථිකව ලාභදායී නොවීම පසුගිය කාලයේ ඇතිවූ බරපතල අර්බුදයකි. තරුණ පරම්පරාව වී වගාවෙන් ඈත්වීම කම්කරුවන් නොමැතිකම, ගොවීන් වගාව පාලනය හරියාකාරව නොකිරීම, අඩු ගුණාත්මයෙන් යුත් සහල් වල සුලභතාවය මේ නිසා ඇතිවූවකි.

මෙම ගැටලු ගැන දැන ගැනීමෙන් පසුව කෘෂිකර්ම අමාත්‍යාංශය 1996 දී පමණ මෙම ගැටලු හඳුනාගෙන එයට විසඳුම් යෝජනා කරන ලෙසට වී අංශය පිළිබඳ කාර්ය සාධන කමිටුවක් පත් කර එයට නියම කරන ලදී.

එම පත් කරන ලද කමිටුවේ නිර්දේශයන් ලෙස ගොවි ජනතාවගේ වී වගා අංශයේ ඵලදායීතාවය නැංවීම සඳහා උපායමාර්ගීය ලෙස වී යාය ආදර්ශන වැඩ සටහන මුලදී වී වගා කරන ප්‍රධාන දිස්ත්‍රික්ක වලත් පසුව ලංකාවේ සෑම තැනකමත් ක්‍රියාත්මක කරන ලදී.

මෙම යාය ආදර්ශන වැඩ සටහන් සාර්ථකත්වය දැනගෙන එය නිෂ්පාදන වැඩසටහනක් ලෙස 1998 සිට ක්‍රියාත්මක විය. මෙම වී නිෂ්පාදන යාය වැඩසටහන මූලික ලෙස උපකල්පන තුනක් මත පදනම් වී ඇත. එය පහතින් දක්වා ඇත.

1. දැනට ඇති තාක්ෂණයෙන් අස්වැන්න වැඩිකල හැකි බව.

2. වී වගාව ආර්ථිකව ලාභදායී කිරීමට ඵලදායිතාවය වැඩිකල යුතු බව.

3. ප්‍රජා සහභාගීත්වය ඇතිව වැඩසටහන ක්‍රියාත්මක කලයුතු බව.

දැනට ඇති තාක්ෂණය ප්‍රමාණවත් බව

ශ්‍රී ලංකාවේ, පස, දේශගුණය, ජල පහසුකම හා අනෙකුත් පහසුකම් අනුව වී වගා කරන පරිසරයන් ප්‍රධාන කාණ්ඩ දෙකකට බෙදිය හැකිය. එනම්

1. වී වගාවට වඩා හිතකර පරිසර

2. වී වගාවට වඩා හිතකර නොමැති පරිසරයන්

වී වගාවට වඩා හිතකර පරිසර වන්නේ ස්ථිර ජල සැපයුමක් ඇති වියලි හා අන්තර් මාධ්‍ය කලාප වේ. මෙම කලාපය තුළ පහත සඳහන් රූප අංක 01 පරිදි අක්කරයට බුසල් 200 ක අස්වැන්නක් ලබා ගැනීමට විභවයක් ඇත. නමුත් එම පරිසර වල ගොවීන් ලබා ගන්නේ අක්කරයට බුසල් 90 ක අස්වැන්නක් පමණි. රූපය අංක: 1

අස්වැන්නේ අද තත්වය

එලෙසම හිතකර නොමැති පරිසර වල එනම් ස්ථිර ජල සම්පාදනයක් නොමැති තෙත් කලාපීය හා පාංශු ගැටළු ඇති ස්ථානවල සාමාන්‍ය නිර්දේශිත ප්‍රභේද වලට අක්කරයට බුසල් 120 ක අස්වැන්නක් ලබා ගැනීමට විභවයක් ඇත. නමුත් ගොවීන් සාමාන්‍ය වශයෙන් ලබා ගන්නේ අක්කරයට බුසල් 50 ක පමණ අස්වැන්නකි.

මෙම පරිසරවල සාමාන්‍ය විභවයේ ගොවීන් ලබාගන්නේ 45% ක් පමණි. එයට හේතුව වී ඇත්තේ වගා පාලන තත්වයන් හරියාකාරව නොලැබීමයි. එබැවින් වගා පාලන තත්ත්වයන් හරියාකාරව ලැබීමෙන් අස්වැන්න වැඩි කිරීමට හැකියාවක් ඇත. ගොවි මහතා වගාවට අවශ්‍ය තත්ත්වයන් හරියාකාර ලබානොදෙනුයේ ඔහුට බලපාන සමාජ ආර්ථික ගැටලු නිසාවෙනි. මෙයට තාක්ෂණික කරුණු මෙන්ම තාක්ෂණික නොවන කරුණු ද බලපායි. තාක්ෂණික නොවන කරුණු අතර යෙදවුම් සපයා ගැනීම, ණය පහසුකම්, වෙළඳපොල යන කරුණු වේ. මෙම ගැටලු විසඳීමෙන් අස්වනු තත්ත්වය දියුණු කරගත හැකි බව උපකල්පනය කෙරේ.

වී වගාව ආර්ථිකව ලාභදායී වීමට ඵලදායීතවය වැඩිකලයුතු බව

සාමාන්‍යයෙන් වී අක්කරයක් වගා කිරීම සඳහා පවුලේ කම්කරු ශ්‍රමයන් එකතු කල පසු රු. 16,000/= ක් පමණ වැය වේ. මෙයින් 50% ක්ම කම්කරු වියදම වන අතර යෙදවුම් සඳහා වියදමින් 25% ක්ද බලය සඳහා වියදමින් 25% ක්ද පමණ වැය වේ.

වී වගාවේ වියදම අඩු කිරීමට ඇති හැකියාව ඉතාමත් අල්පය. අක්කරයකට යන වියදම අඩු කිරීමෙන් අස්වැන්න තවත් අඩුවී වී වගාවකින් අලාභදායී තත්ත්වයකට පත් වේ. පවතින එකම විකල්පය නම් ඉතා සුළුවෙන් හෝ වියදම වැඩිවුනත් ක්‍රමානුකූලව වගා කර අස්වැන්න වැඩිකර ගැනීමයි. අක්කරයට බුසල් 120 දක්වා අස්වැන්න වැඩිකර ගත හැකිනම් පහත වගුව 03 හි සඳහන් පරිදි කිලෝ ග්‍රෑම් 1 නිෂ්පාදනය රුපියල් 8.90 සිට 7.30 දක්වා අඩුකර ගත හැකිය. මේ අවස්ථාවේ අක්කරයකින් රුපියල් 11,300/= ක් ලාභවන අතර, වී වගාවේ රැඳී සිටිය හැකි මට්ටම ලෙස මෙම අවස්ථාව හැඳින්වේ.

අක්කරයට බුසල් 160 ගන්නා අවස්ථාවේදී එක් වී කිලෝ ග්‍රෑමයක් සඳහා නිෂ්පාදන මිල 5.78 වන අතර අක්කරයකට ලාභය රුපියල් 19,900/= ක් වේ. මෙය වී වගාව ලාභදායී අවස්ථාවකි. මෙවැනි අස්වනු මට්ටම් වලදී වී

වගාව වාණිජ වගාවක් වශයෙන් සැලකිය හැකිය. එලෙසම අස්වැන්න අක්කරයට බුසල් 180-200 ලබා ගන්නා විට වී වගාව ඉතාමත් ලාභදායී ලෙස සැලකිය හැකිය.

වගුව අංක 3: නිෂ්පාදන වියදම -අක්කරයට/රුපියල්

අස්වැන්න බුසල්	වියදම රු.	වියදම කි.ග්‍රෑ. 10 රු.	ආදායම රු.	ලාභය රු.
200	15.500	4.87	48.000	28.500
160	18.500	5.78	38,400	19,900
120	17.500	7.30	28.800	11,300
90	16.000	8.90	21,600	5.600

ආදායම ගණනය කිරීමේදී වී කිලෝ ග්‍රෑමයකට රු. 12.00 ලෙස සලකා ඇත.

ප්‍රජා සහභාගීත්වය ඇතිව වැඩසටහන් ක්‍රියාත්මක කලයුතු බව

ගොවි ජනතාවගේ අභිවෘද්ධිය සඳහා කෙරෙන වැඩසටහන් ඔවුන්ගේම සහභාගීත්වයෙන් කළ යුතුයි. වී නිෂ්පාදන යාය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම් කරණුයේ ගොවි කණ්ඩායම විසිනි. ගොවි කණ්ඩායම සම්බන්ධවීම නිසා ඔවුන්ගේ නායකත්ව හැකියාව කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමේ හැකියාව දියුණුවන අතර එය ඵලදායීත්වය දියුණු කිරීම සඳහා ඉතාමත් වැදගත් වේ.

තවද ප්‍රජා සහභාගීත්වය නිසා මෙම වැඩ සටහන් සඳහා ගොවීන්ගේ සම්මුතිය හා ආශිර්වාදය ලැබෙන අතර නිලධාරියෙකුට තනියම කරගත නොහැකි විශාල වැඩ ප්‍රමාණයක් ගොවීන්ගේ සහභාගීත්වය ඇතිව කරගත හැක.

වී නිෂ්පාදනය යාය වැඩසටහන

“වී” නිෂ්පාදන යාය වැඩසටහන යනු ගොවීන් 20-30 ක පමණ කණ්ඩායමක අඛණ්ඩ වී වගා යායක (අක්කර 50 ක පමණ) වගාකරන අවස්ථාවක ඔවුන් එකම කණ්ඩායමක් බවට පත්කර කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමට සලස්වයි. ඔවුන්ගේ වගාවෙන් උපරිම අස්වැන්නක් ලබා ගැනීම සඳහා නිර්දේශිත නව දියුණු තාක්ෂණ කට්ටලයක් අනුගමනය කිරීමට අවශ්‍ය උපදෙස් සපයනු ලැබේ. මෙම තාක්ෂණ පිළිවෙත් අනුගමනය කිරීම සඳහා අවශ්‍ය යෙදවුම් විශේෂයෙන් පොහොර සහ අවශ්‍ය ප්‍රමාණයෙන් බිත්තර වී ණය ක්‍රමයක් මගින් ගොවීන්ගේම අරමුදලක් මගින් සැපයීමට කටයුතු කරයි.

මෙහිදී විශේෂත්වය වන්නේ තෝරාගත් ගොවි නායකයින් මගින්ම මෙම කටයුතු සංවිධානය කර ගැනීමයි. පොහොර සපයා ගැනීම, ගොවීන් අතර බෙදා ගැනීම, එම ණය මුදල් ඇතොත් කන්නය අවසානයේ එකතු කිරීම යනාදී කරුණු සියල්ලම ගොවීන් විසින්ම ක්‍රියාත්මක කරයි. මෙයට අමතරව කණ්ඩායම එකිනෙකා අතර පවතින සම්බන්ධතාවය හා සමාජමය බලපෑම නිසා නිර්දේශිත පිළිවෙත් ඔවුන්ට හැකි පමණින් ක්‍රියාත්මක කර සෑම අයෙක්ම සමාන මට්ටමක ක්ෂේත්‍රයන් පවත්වා ගෙන යාමට උත්සාහ දරයි.

තාක්ෂණ පිළිවෙත් කට්ටලය

වී වගාවේ අස්වැන්න වැඩිකිරීම සඳහා තාක්ෂණ පිළිවෙත් තනි තනිව හුදකලාවම භාවිතයෙන් ප්‍රතිඵලයක් නොමැති බැව් පෙනී ගොස් ඇත. අත්‍යාවශ්‍යම තාක්ෂණයන්, කට්ටලයක් ලෙස භාවිතා කිරීමෙන් පමණක් අස්වැන්න වැඩිකර ගත හැකි බැව් හොඳින් පැහැදිලි වී ඇත. මෙම තාක්ෂණය කට්ටලයේ පහත සඳහන් කරුණු 5 ප්‍රධාන තැනක් ගනී.

1. කන්නයට වගාව ආරම්භය
2. නියම ලෙස බිම් සකස් කිරීම
3. පාංශු පෝෂකත්වය දියුණු කිරීම
4. නියමිත ප්‍රභේදය හා උසස් ගුනාත්මය බිත්තර වී භාවිතය
5. ඒකාබද්ධ පලිබෝධ පාලනය හා වල් මර්ධනය



මෙම කරුණු පහෙන්ම වඩාත් අවධාරනය කරන කරුණ වනුයේ පාංශු පෝෂකත්වය දියුණු කිරීමයි. මේ සඳහා කාබනික පොහොර යෙදීම සම්බන්ධයෙන් ගොවීන් වැඩි යොමුකිරීමක් කරන අතර ඊට අමතරව රසායනික පොහොර නිර්දේශය අනුව යෙදීමටද කටයුතු කෙරේ. කාබනික පොහොර ලෙස පසුගිය කන්නයේ පිදුරු ප්‍රමාණය, කොළ අතු මිටි 30 - 40 ක් යෙදීම, ගොම පොහොර ටොන් 2 ක් යෙදීම නැතහොත් කුකුළු පොහොර ටොන් එකක්ද, දහයියා අඟුරු කිලෝ ග්‍රෑම් 250 ක් බැගින්ද යෙදීමට උනන්දු කෙරේ.

රසායනික පොහොර ලෙස වියලි හා අන්තර් මාධ්‍ය කාලාප වලදී අස්වැන්න අක්කරයට බුසල් 140 ට වැඩි අස්වැන්නක් සඳහා පහත සඳහන් පොහොර ප්‍රමාණය නිර්දේශ කෙරේ.

වගුව අංක 4 :අක්කරයකට බු. 140 ට වැඩි අස්වැන්නක් සඳහා

	යූරියා කි.ග්‍රෑ.	ටීඑස්පී කි.ග්‍රෑ.	එම්ඕපී කි.ග්‍රෑ.	සින්ක් සල්ෆේට් කි.ග්‍රෑ.
මූලික පොහොර	5	45	15	2
1. මතුපිට-සති 2දී	30	-	-	-
2. මතුපිට-සති 5-6දී	55	-	-	-
3. මතුපිට-සති 7-8දී	35	-	20	-
එකතුව	125	45	35	02

තෙත් කලාපයේ පාංශු ගැටලු රහිත ස්ථානවල අක්කරයට බුසල් 100-120 අතර අස්වැන්නක් සඳහා පහත නිර්දේශය භාවිතා කළ හැක.

වගුව අංක 5: තෙත් කලාපයේ අක්. බුසල් 100 ක් සඳහා

	යූරියා කි.ග්‍රෑ.	ටීඑස්පී කි.ග්‍රෑ.	එම්ඕපී කි.ග්‍රෑ.	සින්ක් සල්ෆේට් කි.ග්‍රෑ.
මූලික පොහොර	5	35	15	02
1 මතුපිට සති 2	20	-	-	-
2 මතුපිට සති 56	30	-	-	-
3 මතුපිට සති. 78	15	-	15	-
එකතුව	70	35	30	02

ගොවි මහතාගේ වගා පාලන දක්ෂතාවය අනුව හා කාබනික පොහොර යොදන ප්‍රමාණය අනුව අමතර පොහොර නිර්දේශ කරනු ලැබේ. කිසිවිටකත් කාබනික පොහොර නොයොදා රසායනික පොහොර මගින් පමණක් වැඩි අස්වැන්නක් ලබාගත නොහැකි බැව් හොඳින් අවබෝධ වී ඇත.

කන්නයටය වගා කිරීම

යායේ ගොවි කණ්ඩායමේ සියලු දෙනාම එක්ව එකවිට වගා කිරීමත්, නියමිත කන්නයට වගා කිරීමත් යන කරුණු දෙකම ක්‍රියාත්මක විය යුතුය. නියමිත කන්නය ගැන සැලකීමේදී මහ කන්නයේදී මුල් කාලයේ වර්ෂාවෙන් ඉඩම් සැකසීම සඳහා ප්‍රයෝජනයට ගැනීමටත්, දෙසැම්බරයේ ගොයම වර්ධනය වීමට හැරීමටත් ලෙඩ රෝග වලින් ආරක්ෂා වීමටත්, ජනවාරි 15 පසුව පිදීමට සැලසීමෙන් සීතලෙන් බොල්වීම ආරක්ෂා වීමටත්, පෙබරවාරි, මාර්තු වියලි කාලගුණයක් පවතින විට අස්වැන්න නෙලා ගැනීම හා වියලීම පහසු වන ආකාරයටත් වගාව ආරම්භ කලයුතුය. මේ සඳහා

මාස 3 1/2 වගී - නොවැ. 15-30 අතරත්

මාස 4 වගී - නොවැ. 1-15 අතරත් වැපිරිය යුතු වන්නේය.

යල කන්නයේදී වැඩිම අස්වැන්න ගැනීම සඳහා වගාව අගෝස්තු 15 හා සැප්තැම්බර් 15 අතර අස්වැන්න නෙලන ආකාරයට සකස් කර ගත යුතු වේ. එහෙයින් යල් කන්නය සඳහා වගාව ආරම්භය සඳහා

මාස 3 1/2 වගී - මැයි 1 - 15 ත් අතරත්

මාස 3 වගී - මැයි 15 - 30 අතරත් වැපිරිය යුතු වන්නේය.

හොඳින් බිම් සකස් කිරීම

බිම සකස් කිරීමේදී විශේෂයෙන් සකස් කරන ගැඹුරත්, සකස් කිරීම සඳහා ගතකරන කාලසීමාවත්, මට්ටම් කිරීමත් හරියාකාරව කල යුතුයි.

පළමු බිම් සැකසුම් අඟල් 8-10 ත් ගැඹුරට කැඩෙන සේ, කාබනික ද්‍රව්‍ය දිරන සේ පළමු බිම් සැකසීමේ සිට වැපිරීම දක්වා දින 21 ක් ගතවන සේත් කාලසීමාවක් ලබාදිය යුතුය. මට්ටම් කිරීම නිවැරදිව කලයුතු වේ. නියර නියම ලෙස බැඳීමෙන් ජල පාලනය හරියාකාරව සිදුකල හැකි වන්නේය.

උසස් ගුණාත්මයේ බිත්තර වී භාවිතය

වැඩි අස්වනු ලබා ගත හැකි ප්‍රභේද ලෙස පහත සඳහන් ප්‍රභේද හඳුන්වා දිය හැකිය.

මාස 3 ප්‍රභේද - බීජී 300, බීජී 304, ඒටී 303

මාස 3 1/2 ප්‍රභේද -බීජී 352, බීජී 94-1, බීජී 357, බීජී 358, ඒටී 353, ඒටී 354, බීජී 360, බීජී 359

මාස 4 - බීජී 379-2, ඒටී 402, ඒටී 403, බීජී 450
- ඒටී 95-4-3

උසස් ගුණාත්මයේ බීජ ලෙස 85% පැලවෙන, වල්පැල බීජ වලින් තොර, වෙනත් වී වගී සමග කවලම් නොමැති බිත්තර වී වගී භාවිතා කල යුතුයි. වපුරන විට සාමාන්‍යයෙන් අක්කරයට බුසල් 2 1/2 - 3 ත් අක්කරයක් සඳහා භාවිතා කිරීම සුදුසු වන අතර පැල සිටුවන්නේ නම් 4" × 4" පරතරයට හෝ 6" × 4" පරතරයට අහඹුව හෝ පෙලට සිටුවීම කළ හැකිය. තෙත් කලාපයේදී වැඩි පරතරයක් ලබාදීම සුදුසු වන්නේය. විශේෂයෙන් රෝග වලට පාත්‍රවීමට අඩු පරතර වලදී වැඩි ප්‍රවනතාවයක් දක්වයි.

ඒකාබද්ධ පලිබෝධ පාලනය හා වල් මර්ධනය

පාංශු පෝෂකත්‍වය දියුණුවීමත් සමගම වල් පැල ගහනය වැඩිවන නිසා වල් මර්ධනය කෙරෙහි විශේෂ ක්‍රියාමාර්ග ගත යුතුය. නිර්දේශිත වල් නාශක වගී මේ සඳහා යෙදිය හැකිය. කිසිවිටකත් 34DPA හා MCPA කවලම් කර යොදන්න එපා. ඒවා නිර්දේශිත කාලසීමාවන්හිදී පමණක්ම යෙදිය යුතුයි. නොමිනි, ලෙක්ස්ප්‍රො වැනි නව වල්නාශක වගී තෘණ, පළල් පත්‍ර, පන් වැනි සියළුම වල් පැලෑටි පාලනය කරන බැවින් එම වල් නාශක වගීද භාවිතා කල හැකිය.

1998 සිට මේ දක්වා ලංකාවේ විවිධ දිස්ත්‍රික්ක වල කරන ලද යාය වැඩසටහන් ප්‍රමාණය හා එයට සම්බන්ධ වූ වපසරිය හා ගොවීන් සංඛ්‍යාව පහත වගුව අංක 6 හි දක්වා ඇත. මෙම යාය වැඩ සටහන් පැවැත්වීමේදී ද වියලි හා අන්තර් මාධ්‍ය දේශගුණ කලාප වල වාරි පහසුකම් ඇති ප්‍රදේශ වලට වැඩි ප්‍රමුඛත්‍වයක් දක්වන ලදී.

වගුව 6: 1998 - 2002 දක්වා පවත්වන ලද වී නිෂ්පාදන යාය සංඛ්‍යාව

කන්නය	1998 යල	1998/99 මහ	1999 යල	1999/00 මහ	2000 යල	2000/01 මහ	2001 යල	2001/02 මහ
යාය සංඛ්‍යාව	387	871	823	1153	1150	1479	1609	2424
යාය වල වපසරිය අක්කර	21207	35947	40972	55537	55500	63025	61335	96198
සම්බන්ධ වූ ගොවීන් සංඛ්‍යාව	10490	17741	19456	27325	26509	32630	37370	57375

මෙම යාය වල අස්වැන්න වැඩිවීම පරීක්ෂා කිරීම සඳහා කන්නය අවසානයේ අස්වනු සමීක්ෂණයන් ජනලේඛන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලැබේ. ඒ අනුව එක් එක් ප්‍රදේශ වල ඇති යායන්හි සාමාන්‍ය අස්වැන්න ප්‍රකාශ කරනු ලැබේ. ඒ අනුව එම කන්නයේ දිවයින පුරා පවත්වන ලද සියළුම යායන්හි සාමාන්‍ය අස්වැන්නත්, මාතය (mode) එම කන්නයේ වැඩිම අස්වැන්න ගත් යායේ අස්වැන්නත් යාය වැඩසටහන. පිටින් ඇති සාමාන්‍ය ගොවීන්ගේ සාමාන්‍ය අස්වැන්නත් වගුව අංක 07 හි දක්වා ඇත.

සමස්ථයක් වශයෙන් ගත් කල යාය වැඩසටහනට පිටත ප්‍රදේශ වල අස්වැන්නට වඩා යාය වැඩසටහන සම්බන්ධ ක්ෂේත්‍ර වල අස්වැන්න අක්කරයට බුසල් 30 - 40 ක පමණ වැඩිවීමක් දක්නට ඇත. ඊට අමතරව ඉහළම අස්වැන්නක් ගත් යායේ අස්වැන්න සාමාන්‍ය පිටත අස්වැන්නට වඩා දෙගුණයටත් වඩා වැඩි අගයක් පෙන්නුම් කර ඇත.

වගුව 07 : **යාය වැඩසටහන සම්බන්ධ ක්ෂේත්‍රවල අස්වැන්න - අක්කරයට බුසල්**

කන්නය	යායවල වාර්තා වූ වැඩිම අස්වැන්න	යාය වල අස්වැන්න මාතය	යාය වල සාමාන්‍ය අස්වැන්න	යායට පිටත ක්ෂේත්‍රවල අස්වැන්න
98 යල	180.6	100	115	73.8
98/99 මහ	191.8	120	111	70
99 යල	187.2	115	101	72.7
99/00 මහ	160.8	112	108	73.6
00 යල	147.4	95	103	76.8
00/01 මහ	151.4	95	108	74.3
01 යල	153.4	98	105	79.6

පහත වගුව පරීක්‍ෂා කිරීමේදී යාය වැඩසටහනේ කන්න කිපය තුල අස්වැන්න අඩුවීමක් දක්නට ඇත. එයට හේතු වී ඇත්තේ යාය වැඩසටහන ආරම්භ කරන අවධියේදී ප්‍රධාන වශයෙන් වී වගාවට ඉතාමත් හිතකර වගා පරිසර වලට පමණක් යාය වැඩසටහන සීමාවීමයි. ඊට පසු කන්න වලදී වී නිෂ්පාදන යාය වැඩසටහෙන් වැඩි සංඛ්‍යාවක් ක්‍රියාත්මක වීම නිසා අනෙක් ආන්තික ඉඩම් වලද යාය වැඩසටහන් ක්‍රියාත්මක වීම නිසා සාමාන්‍ය අස්වැන්නේ අඩුවීමක් දක්නට ඇත.

වී නිෂ්පාදන යාය වල තාක්‍ෂණයන් යාය වැඩසටහනින් පිටතට යාම නිසා පිටත සාමාන්‍ය අස්වැන්නේ පැහැදිලි වැඩිවීමක් ද දක්නට ඇත.

මෙම වී නිෂ්පාදන යාය වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා වගුව අංක 8 සඳහන් පරිදි 1998 සිට රජය විසින් මේ දක්වා රුපියල් මිලියන 64.5 ක් වියදම් දරා ඇත. ඒ නිසා වැඩිවූ අස්වැන්නේ වටිනාකම රුපියල් මිලියන 2000 කි. එනම්, මෙවැනි කටයුතු සඳහා රජය වියදම් කරන මුදලින් සෑම රුපියල් එකකටම රුපියල් 30/= ක පමණ ප්‍රතිලාභයක් රටට ලැබී ඇත.

යාය වැඩසටහන පවත්වාගෙන යාමත් සමගම, එම වැඩසටහනේම අතුරු කාර්යයක් වශයෙන් එයට සමගාමීව තවත් ක්‍රියාකාරකම් රාශියක් පවත්වාගෙන යන ලදී. වී නිෂ්පාදන යාය වැඩසටහන සාර්ථකව පවත්වාගෙන යාමටද, එම ක්‍රියාකාරකම් අත්‍යාවශ්‍ය විය. ඉහතින් දක්වා ඇති වියදම් එම අතුරු කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා වූ වියදම්ද ඇතුලත්ව ඇත. එම අතුරු වැඩසටහන පහතින් දක්වා ඇත.

1. ගොවීන් සහ නිලධාරීන් දැනුවත් කිරීම.
2. ගොවීන් තාක්‍ෂණික දැනුවත් කිරීම සඳහා ආදර්ශන වැඩසටහන් පැවැත්වීම.
3. කාබනික පොහොර භාවිතය ප්‍රවර්ධන වැඩසටහන්.
4. කෘෂි යන්ත්‍ර භාවිත ප්‍රවර්ධනය.
5. පසු අස්වනු තාක්‍ෂණය සහ සහල් ගුණාත්මය දියුණු කිරීමේ වැඩසටහන්
6. බිත්තර වී නිෂ්පාදනය හා වී අලෙවිය දියුණු කිරීමේ වැඩසටහන්

වගුව අංක 8: යාය වැඩසටහනේ වියදම් කරන මුදලට ලැබුණු ප්‍රතිලාභය

වර්ෂය	වියදම් වූ මුදල්	වැඩි වූ නිෂ්පාදනයේ වටිනාකම	ආයෝජන ප්‍රතිලාභ අනුපාතය
1998	4.5	135.0	30.0
1999	20.0	441.5	22.0
2000	21.5	643.9	29.9
2001	18.5	780.0	42.1
එකතුව	64.5	2000.4	31.1

ගොවීන් හා නිලධාරීන් දැනුවත් ... නෙලන යන්ත්‍ර...

ලංකාවේ දිස්ත්‍රික්ක 22 ක විවිධ ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරින් 1,185 ක්ද ඔවුන්ගේ රාජකාරි කාලයෙන් 75% දයකත්වයක් ලබා දී මෙම වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. තවද මෙයට අමතරව කෘෂිකර්ම සංවර්ධන පර්යේෂණ සහායක වරුන් 2,500 ක් පමණ මෙම කටයුත්තට සහභාගි වේ. ඔවුන් මෙම වැඩසටහන පවත්වාගෙන යාමටත්, ඒ සම්බන්ධ තාක්ෂණික කරුණුත් අදාල අතුරු කාර්යයන් පවත්වාගෙන යාමටත්, කන්නයකට වතාවක්වත් දැනුවත් කල යුතුයි. තවද මෙම වැඩසටහන සඳහා කන්නයක් පාසා ගොවීන් 58,000 ක් පමණ සම්බන්ධ වන අතර ඔවුන් වෙනුවෙන් යාය සංකල්පය, තාක්ෂණය කට්ටලය, යාය වැඩසටහන් පවත්වාගෙන යාම, කණ්ඩායමක් වශයෙන් කටයුතු කිරිම, නායකත්ව ගතිගුණ පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්විය යුතු වේ. මේ සඳහා කන්නයකට අඩුම වශයෙන් පුහුණු පංති 03 ක් වත් පැවැත්විය යුතුවේ.

ආදර්ශණ වැඩසටහන්

ආදර්ශණ වැඩසටහන් වශයෙන් ප්‍රධාන වශයෙන් වර්ග තුනක් ක්‍රියාත්මක වේ.

1. උපරිම අස්වනු ආදර්ශණ (අක්කර 1)
2. වල් පැලැටි පාලන ආදර්ශණ
3. උපරිම අස්වනු ආදර්ශණ (යාය)

මීට අමතරව විවිධ ආයතන සම්බන්ධ කරගෙන හෝ ගොවීන්ගේම වියදමින් ඒ ඒ ප්‍රදේශ වල කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරින්ගේ මැදිහත්වීම මත කාබනික පොහොර ලබාදීම හා නව වී ප්‍රභේද ආදර්ශණ ද ක්ෂේත්‍රයේ පවත්වනු ලැබේ.

උපරිම අස්වනු ආදර්ශණ

මෙය එම වගා වසසරියේ උපරිම අස්වැන්න ලබා ගැනීමට ආදර්ශණය කිරීමට ගොවි ක්ෂේත්‍ර වල අක්කර එකක බිම් ප්‍රමාණයක පවත්වනු ලැබේ. මෙහිදී ගොවියා විසින්ම උපරිම අස්වැන්න ලබා ගැනීමට නිර්දේශිත තාක්ෂණය අනුගමනය කළ යුතු අතර ඒ සඳහා දිරි ගැන්වීමක් වශයෙන් රසායනික පොහොර ප්‍රමාණයන්, කාබනික පොහොර වශයෙන් අක්කරයට ටොන් 2 ක් සැපයීමට කටයුතු කරනු ලැබේ. මෙවැනි ආදර්ශණ 700 ක් පමණ කන්නයකට පවත්වන අතර එක් කන්නයකදී මෙවැනි ආදර්ශණ 50-60 අක්කරයට බුසල් 200 සීමාව ඉක්මවූ අස්වැන්නක් ලබාගැනීමට හැකිවී ඇත. ශ්‍රී ලංකාවේ වැඩිම වියදමක් දරා පවත්වන ලද ආදර්ශණ වැඩසටහන ලෙසද හඳුන්වා දිය හැකිය. එක් එක් කන්නවලදී පැවැත්වූ උපරිම අස්වනු ආදර්ශණ වල වැඩිම අස්වැන්නත්, සාමාන්‍ය අස්වැන්නත් මානයන් වගුව අංක 09 හි සඳහන් කර ඇත.

වගුව අංක 09 : උපරිම අස්වනු ආදර්ශණ [illegible] යාය වැඩසටහන [illegible]ල්

කන්නය	වියලි කලාපය අස්වැන්න			[illegible]තෙත් කලාපය අස්වැන්න		
	උපරිම	මාතය	සාමාන්‍ය	උපරිම	මාතය	සාමාන්‍ය
99 යල	203	140	135	-	-	-
99/00 මහ	225	130	135	-	-	-
00 යල	208	160	122	134	122	106
00/01 මහ	204	120	128	145	105	107
01 යල	195	140	126	132	90	100

මෙයින් පෙන්නුම් කරන වැදගත් කරුණක් නම් මෙම ප්‍රදේශ වල ගොවීන්ගේ අස්වැන්න ඉතා විශාල ප්‍රමාණයකින් ඉහළ නැංවීමට තාක්‍ෂණික හැකියාවක් ඇති බවයි.

මීට අමරතව මෙම තාක්‍ෂණයම සම්පූර්ණ යාය කණ්ඩායමක් විසින්ම වී නිෂ්පාදන යායක ක්‍රියාත්මක කර ගොවීන් විසින්ම ක්‍රියාත්මක වන ඔවුන්ගේ අරමුදලක් මගින් කන්නයක් පාසා කන්නයක් ක්‍රියාත්මක කරන උපරිම අස්වනු ආදර්ශණ යාය වැඩසටහන් ද ක්‍රියාත්මක වේ. මෙම උපරිම වී අස්වනු යායන් ප්‍රධාන වී වගා කරන දිස්ත්‍රික්ක වල කන්නයට එකක් බැගින් ක්‍රියාත්මක කරනු ලැබේ. මෙය විශාල ප්‍රදේශයක ක්‍රියාත්මක වන නිසා තාක්‍ෂණිකව විශාල බිම් ප්‍රමාණයක කලහැකි බවත් මෙම යාය ආදර්ශණ සංකල්පය වෙනත් ග්‍රාමීය කෘෂිකර්මීය සංවර්ධනය කරන ආයතන වලට ආදර්ශනය කිරීමක්ද සිදු කරනු ලැබේ.

මීට අමතරව වී වගාවේ තවත් ප්‍රධාන ගැටළුවක්ව පවතින වල් පැල මර්ධනය හරියාකාරව කිරීම සහා විශේෂයෙන්ම වල් නාශක ක්‍රමවත්ව යෙදීමටත් නව වල් නාශක වර්ග හඳුන්වා දීමටත් ආදර්ශණ පවත්වනු ලැබේ.

කාබනික පොහොර භාවිත ප්‍රවර්ධන වැඩසටහන්

පිදුරු පොහොරක් ලෙස යෙදීම, කොල අතු පොහොර යෙදීම, ගොම පොහොර, කුකුළු පොහොර යෙදීම, දහයියා අඟුරු යෙදීම වැනි කාබනික පොහොර භාවිතා ප්‍රවර්ධන වැඩසටහන් පවත්වනු ලැබේ. තවද කොල පොහොර දැමීම සඳහා නිර්දේශිත ගස් වර්ග සිටුවීමේ ශ්‍රමදානයක් ද පවත්වනු ලැබේ.

ගොම පොහොර භාවිතය දියුණු කරලීම සඳහා ගව ගාල හා ගොම එකතු කිරීමේ වේදිකාව/වල තැනීම සඳහා සහභාගී වන ගොවීන්ට සිමෙන්ති ලබාදීමේ වැඩසටහනක් ද පවත්වනු ලැබේ. මෙලෙස වර්ෂයකට ගව ගාල් 200 ක් පමණ ඉදිකර ඇත.

තවද දහයියා පුළුස්සා අඟුරු කිරීම හා ඒවා කාබනික පොහොරක් ලෙස යෙදීම සඳහා කුන්තානි ආදර්ශණ මට්ටමින් පිළියෙල කිරීමේ වැඩසටහන් ද පවත්වනු ලැබේ.

කෘෂි යන්ත්‍ර භාවිතය

කම්කරු වියදම අඩුකර ගැනීමටත්, වී වගාව තරුණයින්ට ආකර්ශණීය කර්මාන්තයක් කිරීමටත්, පලදායිතාවය හා ගුණාත්මය දියුණු කිරීමේ අරමුණින් නව කෘෂි යන්ත්‍ර හඳුන්වා දීමට කටයුතු කරනු ලැබේ. මේ සඳහා

විශේෂයෙන් සංයුක්ත අස්වනු නෙලන යන්ත්‍රය (Combine Havester) අසුවන් පැගීමේදී පඩංගු භාවිතය, කුඩාරම් භාවිතය, ට්‍රැක්ටර් හා නගුල් භාවිතය, කොළ මඩින යන්ත්‍ර භාවිතය, පෙළට ඇට දැමීමේ උපකරණය භාවිතය යනාදිය ජනප්‍රිය කරවීමට ක්‍රම ආදර්ශන පවත්වනු ලැබේ. මීට අමතරව කාබනික පොහොර නිෂ්පාදනය සඳහා චොපර් (chopper) යන්ත්‍රය භාවිතය ද ආදර්ශණ මට්ටමින් පවත්වනු ලැබේ.

පසු අස්වනු තාක්‍ෂණය හා සහල් ගුණාත්මය දියුණු කිරීමේ වැඩසටහන්

ලංකාවේ නිපදවන සහල් ශ්‍රී ලංකා ප්‍රමිති නිර්නායක අනුව ඉතාමත් පහළ මට්ටමක පවතී. මෙය සඳහා වී නිපදවන ගොවීන් හා සහල් නිපදනවන මෝල් හිමියන් යන දෙපාර්ශයම කාර්ය භාරය ගැන දැනුවත් කිරීමේ වැඩ සටහන් පසු අස්වනු පිළිබඳ තාක්‍ෂණය ආයතනය සමග සම්බන්ධ වි පවත්වනු ලැබේ.

බිත්තර වී නිෂ්පාදනය - අලෙවිය හා පොහොර සැපයීම සම්බන්ධීකරණය

වී නිෂ්පාදන යාය වල ප්‍රදේශයට අවශ්‍ය බිත්තර වී නිෂ්පාදනය සඳහා හොඳ විභවයක් ඇත. එම ගොවීන් සමග බිත්තර වී නිෂ්පාදන වැඩ සටහන් පවත්වා ගෙන යනු ලැබේ. තවද වී අලෙවිය සම්බන්ධයෙන් ඉදිරි වෙළඳ ගිවිසුම් ඇති කිරීමටත්, පොහොර ණය ගොවීන් වෙත ලබාදීමට එම ආයතන සමග සම්බන්ධීකරණයන් පවත්වාගෙන යාමටත් කටයුතු කරනු ලැබේ.

පසුගිය කන්න 8 තුළ ක්‍රියාත්මක වූ ඉහත වැඩසටහන් නිසා ශ්‍රී ලංකාවේ වී වගාවේ පහත සඳහන් ප්‍රතිඵල ලැබී ඇත.

1. වී වගාව වැඩි අස්වනු ලබාගත හැකි ලාභදායී කර්මාන්තයක් බවට පත් කිරිම.
2. වසර ගණනාවක් එක තැන ඇන හිට තිබුන සාමාන්‍ය වී අස්වැන්න වැඩිවන ප්‍රවනතාවක් පෙන්වීම.
3. ගොවීන් නව තාක්‍ෂණයන්ට අනුවර්තනය කිරීම.
4. කාබනික පොහොර භාවිතය හා ඒකාබද්ධ පලිබෝධ පාලනය වැනි තාක්‍ෂණ ක්‍රම යෙදීමෙන් පරිසරය සුරක්‍ෂිත කිරීම.

වී වගාවන් අක්කරයට බුසල් 150-160 ක වැනි අස්වැන්නක් ලබා ගත් අවස්ථා වලදී එය වාණිජ වගාවක් හෝ මුදල් භෝගයක් (Cash crop) ලෙස සැලකිය හැකිය. වී නිෂ්පාදන යාය වැඩ සටහන සමග ගොවීන් වැඩි අස්වනු ලබා ගැනීම නිසා වී වගාව ලාභදායි කර්මාන්තයක් බවට පත්ව ඇත.

පහත දක්වා ඇති අයුරු වියලි කලාපයේ හෝ අන්තර් මාධ්‍ය කලාපයේ අක්කර 2 1/2 ක් (හෙක්ටයාර් 1 ක්) ඇති ගොවි මහතෙක් අක්කරයට බුසල් 150 ක අස්වැන්නක් ලැබේනම් එම වී කිලෝ ග්‍රෑම් 1 රුපියල් 15/= බැගින් අලෙවි කලහොත් වසරක් තුළදී රුපියල් එක් ලක්‍ෂ පනස් දහසක් පමණ ලාභයක් ගත හැකිය. එක් පවුලක් පහසුවෙන් නඩත්තු කලහැකි තත්ත්වයක් උද වේ.

1. අක්කර 2 1/2 වගා කිරීම සඳහා වියදම = රු. 40,000.00
2. අක්කරය බුසල් 150 බැගින් අක්කර 2 1/2ට අස්වැන්න = කි.ග්‍රෑ.7500
3. රු. 12/= බැගින් අලෙවි කලහොත් ලාභය = (7500×2×12) - 80000 =1,00,000

   මාසයකට ලාභය = රුපි. 8,300.00
4. රු. 15/= බැගින් කලහොත් ලාභය = (7500×2×15) - 80,000 =1,45,000

   මාසයකට ලාභය = රු. 12,100.00

වී වගාවේ සාමාන්‍ය අස්වැන්න වැඩිවීම

ශ්‍රී ලංකාවේ වී වගාවේ සාමාන්‍ය අස්වැන්න හා ජාතික නිෂ්පාදනය වගුව අංක 3 දක්වා ඇති පරිදි 1990 අග භාගය දක්වා ඇනහිට තිබුණි. නමුත් යාය නිෂ්පාදන යාය වැඩසටහන නිසා වී වගාවේ සාමාන්‍ය අස්වැන්න වැඩිවන ප්‍රවනතාවයක් පෙන්නුම් කර ඇත. එය වගුවක අංක 10 හි පෙන්නුම් කර ඇත. මෙපමණ කාලයක් සාමාන්‍ය අස්වැන්න අක්කරයට බුසල් 70-75 පමණ පැවැති අතර පසුගිය කන්න වල අස්වැන්න වැඩි වු අතර 2001 යල කන්නයේ සාමාන්‍ය ජාතික අස්වැන්න සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තු ලේඛණ අනුව අක්කරයට බුසල් 80 ක් (79.6) දක්වා වැඩිවී ඇත.

වගුව අංක 10 : ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අස්වැන්න - 1990 සිට 2001 දක්වා



මහ හා යල කන්න අස්වැන්න වෙනස්වීම බැලිමේදී යල කන්නයේ අස්වැන්න වැඩිවීම ඉතාමත් පැහැදිලිව පෙන්නුම් කෙරේ.

වී වගා කරන ගොවීන් ඉතාමත් නිහඬව මෙවැනි පරිසරයට ගැලපෙන නව තාක්ෂණ ක්‍රම අනුගමනය කිරිම නිසාත්, වැඩි අස්වනු ලබා ගැනීම සඳහා විශේෂ නැඹුරුවක් ඇත. මෙපමණ කලක් නියම ප්‍රයෝජනයට නොගත් ගොම පොහොර සඳහා වී වගාකරන ප්‍රදේශ වල විශාල ඉල්ලුමක් ඇත.

වී නිෂ්පාදන යාය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ඇතිවු ගැටලු හා යෝජනා

1. මෙය ක්‍රියාත්මක කිරිම සඳහා සිටින නිලධාරි සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීම. විශේෂයෙන් පළාත් සභා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ප්‍රදේශ වල කෘෂිකර්ම උපදේශකවරයෙකුට ව්‍යාප්තිය කලයුතු ප්‍රදේශය විශාලය. මෙවැනි නිලධාරින්ට පැවැරී ඇති රාජකාරි අනුව ක්‍රියාත්මක කලහැකි වී නිෂ්පාදන යාය වැඩසටහන් සංඛ්‍යාව සීමා වේ. එබැවින් යාය වැඩසටහන ව්‍යාප්තිය සීමා වී ඇත.

2. මෑතකදී පත්වීම් ලැබූ කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන සහකාර වරුන්ගේ සේවය ද මේ සඳහා හරියාකාරව ලබා ගැනීම එම නිලධාරින් වෙනත් දෙපාර්තමේන්තුවකට අයත්වීම සමහර ප්‍රදේශ වල ගැටලුවක්ව පවතී.

3. යාය වැඩසටහනේ ඉතාමත් වැදගත් අංගයක් නම් යෙදවුම් සැපයිම සඳහා පොහොර ණය සැපයීමයි. නමුත් මේ සඳහා සුදුසු වැඩපිළිවෙලක් හා ප්‍රමාණවත් ආයතන නොමැතිවීම මෙම වැඩසටහන යථා පරිදි ක්‍රියාත්මක කිරීමට බාධකයක් වී ඇත.

ගොවීන් වී විකිණීමේදී වෙළඳ පොල ඇතිවන ගැටළු සහගත තත්වයන් මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට බාධා ඇති වේ. අලෙවිය සඳහා අවදානම වැඩිවන විට ගොවීන් වැඩි අස්වනු සඳහා ආයෝජනය නොකරයි.

5. සහල් වල ගුණාත්මය දියුණු කිරිම සඳහා වී මෝල් නවීකරණය හා මෝල් කරුවන් හා ගොවීන් අතර යහපත් ආකල්ප ඇති කිරිම අත්‍යාවශ්‍ය වේ. මේ සඳහා හිතකර ප්‍රතිපත්තිමය වාතාවරණයක් තවමත් ගොඩ නැගී නැත.

6. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය අනුග්‍රහයන් ප්‍රමාණවත් ලෙස මුදල් ප්‍රතිපාදන ලැබීමත් අත්‍යාවශ්‍ය වේ. දිගුකාලීන වශයෙන් සහල් කර්මාන්තය දියුණු කිරිම සඳහා ප්‍රතිපත්තිමය තිරණ වලත් එය ක්‍රියාත්මක කරන ආයතන හා ක්‍රම වේදයන්ගේ ස්ථාවර තත්ත්වයත් ප්‍රතිපත්ති සම්පාදනයන් ලබාදිය යුතුය.